**දෙහිඕවිට ප්‍රාදේශීය සභාව**
**කෑගල්ල දිස්ත්‍රික්කය**

01. <u>මූල්‍ය ප්‍රකාශන</u>

1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 31 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධි පතිවරයා ගේ වාර්තාව 2014 නොවැම්බර් 17 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 <u>මතය</u>

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>.

1.3.1 <u>රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම.</u>

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි 21(ඈ) වගන්තිය අනුව හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයක් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ප්‍රමිතියේ 21(ඉ) වගන්තිය අනුව අදාල ආයතනයේ අනුමත අයවැය දත්ත සමඟ තථ්‍ය දත්ත සන්සන්දනයන් හෝ මූල්‍ය ප්‍රකාශනවල අයවැය සංඛ්‍යාවන් වෙනම තීරුවක් ලෙස ඉදිරිපත් කලයුතු වුවත්, එසේ ඉදිරිපත් කර නොතිබුණි.

1.3.2 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

(අ) සමාලෝචිත වර්ෂයේ අවසානයට උසාවි දඩ වශයෙන් අවිස්සාවේල්ල මහේස්ත්‍රාත් අධිකරණයෙන් ලැබිය යුතුව තිබූ 2012 වර්ෂයේ හිඟ උසාවි දඩ රු. 477,337 ක් මූල්‍ය ප්‍රකාශන වලට ගෙන නොතිබුණි.

(ආ) 2012 වර්ෂයට අදාල උසාවි දඩ කාර්යමණ්ඩල දීමනා එකතුව රු. 229,271 ක් සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස දක්වා තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ හිඟ උසාවි දඩ කාර්යමණ්ඩල දීමනා රු. 171,496 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) සේවක අර්ථසාධක අරමුදලේ හා සේවක භාර අරමුදලේ 2013 දෙසැම්බර් මස දායකය පිළිවෙලින් රු. 52,381 ක් හා රු.13,095 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ සැපයුම් හා උපකරණ වියදම ගණනය කිරීමේදී තත්‍ය වශයෙන් උපයෝජනය කරන ලද ද්‍රව්‍යවල වටිනාකම වූ රු. 1,582,835 ක් වෙනුවට, වර්ෂය තුල ඒවායේ මිලදී ගැනීම් අගය වූ රු. 1,811,021 ක මුදල වියදම් ලෙසට ගිණුම්ගත කිරීම හේතුවෙන් වර්ෂයේ වියදම රු. 228,186 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ පරිත්‍යාග වශයෙන් ලද රු. 83,122 ක් වූ පුස්තකාල පොත් ගිණුම්ගත කර නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයට අදාල විගණන ගාස්තු සඳහා වෙන් කිරීම් කර නොතිබුණි.

(උ) දේශීය ණය හා සංවර්ධන අරමුදලට ගෙවිය යුතු ණය ශේෂය රු. 1,049,292 ක් අඩුවෙන් ගිණුම්ගත කිරීම නිසා වගකීම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඌ) දේශීය ණය හා සංවර්ධන අරමුදලේ සමාලෝචිත වර්ෂයට අදාල ණය මුදා හැරීම රු. 2,128,975 ක් වැඩියෙන් ගිණුම්ගත කිරීම නිසා වගකීම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

1.3.3 නොසැසඳු පාලන ගිණුම්

ගිණුම් විෂයයන් 04 කට අදාල මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන්ගේ එකතුව රු. 26,393,125 ක් වූ අතර, උපයෝගී ලේඛන/ වාර්තා අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු. 9,741,208 ක් වූයෙන් වෙනස රු. 16,651,917 ක් විය.

1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) 2013 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ලැබිය යුතු ගිණුම් ශේෂ වල වටිනාකම රු. 52,840 ක් විය.

(ආ) 2013 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 9,461,172 ක් විය.

1.3.5 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි, විධිවිධාන වලට හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | | |
|---|---|---|
| (අ) | සබරගමු පළාත් සභාවේ මූල්‍ය රීති සංග්‍රහය<br>283.2, 283.3, 283.4 (අ) (ආ) (ඇ) (ඈ) ඡේද | බැංකු ගිණුමකට (පොදු ගිණුමට) අදාල නිකුත් කල දින සිට මාස 6 ක කාලයක් ඉක්මවා තිබූ එකතුව රු. 881,843 ක් වූ චෙක්පත් 15 ක් සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (ආ) | 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත සහ 2008 පෙබරවාරි 01 දිනැති අංක 1534/8 ගැසට් පත්‍රයේ (iii) උපලේඛණය | 2009 හා 2010 වර්ෂ වල ලබාගත් බලපත්‍ර 7 ක් 2012 හා 2013 වර්ෂයන් හිදි අලුත් කර නොතිබුණි. |

02. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 6,699,513 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 7,385,964 ක් වූයෙන් සමාලෝචිත වර්ෂය තුල මූල්‍ය ප්‍රතිඵලයේ රු. 686,451 ක පිරිහීමක් පෙන්විය.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ සමස්ත වියදම වැඩි වීම මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර්31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 |
| (i) වරිපනම් හා බදු | 3,593 | 2,723 | 870 |
| (ii) බදු කුලී | 6,579 | 5,831 | 748 |
| (iii) බලපත්‍ර ගාස්තු | 852 | 859 | (7) |
| (iv) වෙනත් ආදායම් | 35,761 | 32,939 | 2,822 |

2.3.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ ප්‍රමාණය රු. 3,907,249 ක් වූ අතර, අයවිය යුතු මුද්දර ගාස්තු මුදල ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

03. මෙහෙයුම් සමාලෝචනය

3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2013 වර්ෂයේ අනතුරුදායක ගස් සම්බන්ධ ලේඛණය හා අයදුම්පත්‍ර පරීක්ෂාවේදී වාර්තා වී තිබූ පැමිණිලි සංඛ්‍යාව 128 කි. ඉන් පැමිණිලි 30 ක් සම්බන්ධව පරීක්ෂා කිරීම සඳහා කාර්මික නිලධාරී මහතුන්ට භාරදී තිබුණද ඒ සම්බන්ධව කටයුතු කර ආපසු භාරදී නොතිබුණි.

(ආ) ආපසු ගෙවිය යුතු තැන්පතු යටතේ දක්වා ඇති 2010 වර්ෂයට අදාල රු. 318,393 ක් වූ රඳවුම් බදු මුදල්, 2010,2011,2012 වර්ෂ වලට අදාල රු. 533,136 ක් වූ ජාතිය ගොඩනැගීමේ බදු මුදල් හා 2010 හා 2011 වර්ෂයන්ට අදාල රු. 1,472,555 ක් වූ එකතු කළ අගය මත බදු මුදල් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2013 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම් ශේෂවල එකතුව රු. 3,606,509 ක් වූ අතර, අවුරුදු 01 ක කාලයක් ඉක්මවා අයවීම් හිඟහිටි ගිණුම් ශේෂ වල එකතුව රු. 75,526 ක් විය.

3.2 ආර්ථික නොවූ ගණුදෙනු

සභාව සතු 250-4053 දරණ කැබ්රථය 2012 අප්‍රේල් 30 දින සිට අළුත්වැඩියාව සඳහා යවා තිබූ අතර ඒ සඳහා මාස 07 ක කාලයක් ගතවී තිබුණි. ඒ සඳහා රු. 887,842ක බිල්පතක් ඉදිරිපත් කර තිබුණු නමුත් අළුත්වැඩියා කටයුතු සාර්ථකව සිදුකර නොතිබීම නිසා නැවත අළුත්වැඩියා කිරීමට සිදුවී තිබුණි.

04. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

4.1 අභ්‍යන්තර විගණනය

1988 ප්‍රාදේශිය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 5(7) ප්‍රකාරව මූල්‍ය හා ගබඩා සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් පවත්වා නොතිබුණි.

05. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) සේවක ණය අයකර ගැනීම

(ඇ) ගබඩා පාලනය

(ඈ) වත්කම් කළමනාකරණය